
# කළුගේ



මිනුලි මෙහන්සා දෙහිගම

# තෑග්ග

මිනුලි මෙහන්සා දෙහිගම

කතෘගේ වෙනත් කෘති :

රෝස කඳුළු

2025.02.08

ISBN

978-624-208-490-9

**පිළිගැන්වීම**

මගේ මේ දෙවෙනි

පොත

මං ආදරේම

මගේ අම්මටයි

අප්පච්චිටයි

පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.


ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය හික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



නෝරා හරි ලස්සන ළමයෙක්, හැබැයි ටිකක් අකීකරුයි. ඔන්න හෙට තමයි නෝරාගේ උපන්දිනේ. නෝරා මඟ බලාගෙන හිටියේ එයාගේ උපන්දිනේ එනකං, එයාගේ තෑගි බලන්න.



උපන්දිනය දවසේ උදෙන්ම නැගිටපු නෝරා දුවගෙන දුවගෙන ගියේ තෑගි බලන්න එයාට හරිම සතුටුයි තෑගි දැකලා. ඒත් අන්තිමට ඇරපු පෙට්ටියේ තිබුණේ නෝරා කවදාවත් බලාපොරොත්තු වුණේ නැති විදියේ තෑග්ගක්.



ඒ තමයි පුංචිම පුංචි බලු පැටියෙක්. "ආපෝ... මට නම් එපා මේ ජරා සතා. මං සත්තුන්ට ආස නෑ." නෝරා කිවුවා "අනේ පුතේ, මෙයා කොච්චර ලස්සන බලු පැටියෙක්ද?" අම්මා කිවුවා ඒ උනත් නෝරා අම්ම කියපු දේවල් ගණන් ගත්තේ නෑ.




චූටි බලු පැටියා ටෆී නෝරා වටේම කැරකුණා. එයා යන හැම තැනටම ආවා. ඒත් නෝරා පුංචි ටෆී ව හුරතල් කළේ නෑ. එයා දිහා බැලුවෙත් නෑ. කෑම දුන්නෙත් නෑ.



ඔන්න දවසක් වත්ත පහල පේර ගහේ පේර පිරිලා. නෝරා පේර කන්න හරිම ආසයි. නෝරා උඩ පැන්නා, පැන්නා ඒත් කඩන්න බෑ. එයා හෙමින් හෙමින් අඩිය තියලා ගහ දිගේ නගින්න ගත්තා. දැන්නම් පේර ගෙඩියට තව චුට්ටයි.




තව ටිකක් අත දික් කරනකොටම නෝරා ගහෙන් බිමට වැටුණා. අනේ එයාට නැගිටින්න බෑ. වැලමිට ළඟ ලොකු තුවාලයක්. ඒ මදිවට කකුළත් තුවාල වෙලා හොඳටම රිදෙනවා. නෝරා අඬන්න ගත්තා.



නෝරා ළඟම කැරකි කැරකි හිටිය ටෆී මේක දැකලා හොඳටම කලබල වුණා. එයා ආදරේ නැති උනාට ටෆී එයාට ගොඩාක් ආදරෙයි. ටෆී බුරන්න ගත්තා කාටවත් ඇහෙන්නේ නෑ.



ටෆී ගෙදරටම දිව්වා. අම්මා හොයාගෙන ගිහින් හොඳටම බිරුවා. ”මොකද ටෆී කලබලේ? ”අම්මා ඇහුවා. ටෆී අම්මා එක්ක වත්ත පහළට දිවුවා. ගහ යට තුවාල වෙච්ච නෝරා අඬ අඬා ඉන්නවා.



අම්මා නෝරා ගෙදර ගෙනත් තුවාල වලට බෙහෙත් දැම්මා. ටෆී නෝරා ළඟින් හෙලවුනේ වත් නෑ. "බලන්න නෝරා, ටෆී ඔයාට කොච්චර ආදරේද කියලා. ඔයා වැටුණා කියලා මං දැනගත්තෙත් ටෆී නිසා. දුකේ දි අපිව දාල යන්නේ නැති යාළුවො තමයි අපිට වටින්නේ" අම්මා කිවුවා.



"මට සමාවෙන්නට ඔයා තමයි මගේ හොඳම යාළුවා." නෝරා කීවා. එදා ඉඳන් නෝරා ටෆීට කෑම දුන්නා. ආදරෙන් බලා ගත්තා. නෝරාගේ අකීකරුකම් අඩු වුණා. ටෆී නිසා නෝරා හොඳ ළමයෙක් වුණා.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN
978-624-208-490-9